# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

## 2024 මාර්තු මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**62.5**

**2024 මාර්තු**

**නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පිළිබිඹු කරමින්, නිෂ්පාදන අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2024 මාර්තු මාසයේ දී දර්ශකාංක 62.5ක් වාර්තා කරන ලදී.** මෙම දර්ශකය වසර තුනකින් වාර්තා කළ ඉහළම අගය මෙය වේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් උත්සව සමයේ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් සියලුම උප දර්ශක පෙර මාසය හා සැසඳීමේදී ඉහළ යෑම හේතු විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑම සඳහා ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය සහ රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශය ප්‍රධාන වශයෙන් දායක විය. විශේෂයෙන් ආහාර සහ පාන වර්ග නිෂ්පාදනය කරන්නන් ඇතුළුව බොහෝ නිෂ්පාදකයින් එළඹෙන උත්සව සමය පිළිබඳව සුභවාදී අදහස් පල කරන ලදී. මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑම හා සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද ඉහළ යන ලදී. තවද, මිල මට්ටම්වල පහත වැටීමක් ද වාර්තා විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයට සාපේක්ෂව මාර්තු මාසයේ දී අඩු වේගයකින් වුවද ඉහළ යන ලදී.


**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | පෙබ. | මාර්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.0** | **62.5** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 57.0 | 66.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 55.0 | 67.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 54.0 | 54.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 56.0 | 65.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 58.6 | 55.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් ඉහළ මට්ටමක පවතියි. කෙසේ වෙතත්, උත්සව සමය අවසන් වීමෙන් පසු අප්‍රේල් මාසයේදී නිෂ්පාදනයේ යම් අඩුවීමක් අපේක්ෂා කරන බව ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් සඳහන් කළහ.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global) [1] ආයතනය, 2024 අප්‍රේල් 15 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, එනම් ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, 2024 මාර්තු මාසයේ දී දර්ශකාංක 67.7ක් වාර්තා කරමින් සේවා ක්‍රියාකාරකම්වල තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මෙම අඛණ්ඩ වර්ධනය සඳහා උප අංශ ගණනාවක වාර්තා වූ ඉහළ යෑම් හේතු විය. ඒ අනුව, උත්සව සමයේ විකුණුම් ඉහළ යෑම් හේතුවෙන් තොග සහ සිල්ලර වෙළෙඳාම උප අංශය සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර ඇත. තවද, මූල්‍ය සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සමගාමීව අඛණ්ඩව වර්ධනය විය. මේ අතර, ඉහළ සංචාරක පැමිණීම් හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශය අඛණ්ඩව වර්ධනය වූ අතර, ප්‍රවාහන, අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු සහ වෘත්තීය සේවා උප අංශ ද මාර්තු මාසය තුළ ධනාත්මක වර්ධනයන් වාර්තා කළේය.

ප්‍රධාන වශයෙන්, තොග සහ සිල්ලර වෙළෙඳාම, මූල්‍ය සේවා, රක්ෂණ, ප්‍රවාහන සහ වෘත්තීය සේවා යන උප අංශවල ඉහළ යෑම් සමග මාර්තු මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

උත්සව සමයට සමගාමීව සමාගම් කිහිපයක් විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය මාර්තු මාසයේ දී ඉහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව නමුත් අඩු වේගයකින් පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | පෙබ. | මාර්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | 53.0 | 67.7 | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 54.5 | 64.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.0 | 52.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.6 | 48.3 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 71.2 | 74.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, හිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ට සමගාමීව මාර්තු මාසයේ දී අඛණ්ඩව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**67.7**

**2024 මාර්තු**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global) [1] ආයතනය, 2024 අප්‍රේල් 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමග සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.